# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2026/25 - 2017 ජූලි මස 05 වැනි බදාදා - 2017.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 05/2016

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 6(ඉ) වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 24 වන වගන්තිය යටතේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

2017 ක් වූ ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 අංක 01 දරන සභාධිපත්‍ය (ගාස්තු අයකිරීමේ) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. සභාධිපත්‍ය දේපළ කළමනාකරණය අධිකාරිය විසින් සපයන ලද සේවා සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 6(ඉ) වගන්තිය යටතේ අයකරනු ලබන ගාස්තු මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු ය.

**උපලේඛනය**

1.

| සහතිකපත් නිකුත් කිරීමට අදාළ ගාස්තු | |
|---|---|
| 1. අයදුම්පත් ගාස්තුව | නියමිත ගාස්තුව |
| සභාධිපත්‍ය දේපළක, අර්ධ සභාධිපත්‍ය දේපළක හෝ තාවකාලික සභාධිපත්‍ය දේපළක පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරිවරයාගේ සහතිකය ලබාගැනීම සඳහා ඉදිරිපත් කළයුතු අයදුම්පත් ගාස්තුව. | රු. 500.00 |
| | ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් එකතු වේ. |




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | | |
|---|---|---|
| 2. මූලික නිෂ්කාශන ලිපිය සඳහා සැකසීමේ ගාස්තුව. | මූලික නිෂ්කාශන ලිපිය ලබාගන්නා විට සැකසීමේ ගාස්තුවෙන් 25% ක් ගෙවිය යුතු ය. | |
| 3. සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් ඉදිරිපත්කර ඇති අයදුම්පත් සඳහා සැකසීමේ ගාස්තු. | නේවාසික නියමිත ගාස්තුව | වාණිජ නියමිත ගාස්තුව |
| | ව. මී. 1 කට | |
| ව. මී. 0 - 500 දක්වා | රු. 30.00 | රු. 50.00 |
| ව. මී. 501 - ව. මී. 1,000 දක්වා | රු. 75.00 | රු. 150.00 |
| ව. මී. 1,001 - ව. මී. 3,000 දක්වා | රු. 250.00 | රු. 450.00 |
| ව. මී. 3,001 - ව. මී. 5,000 දක්වා | රු. 300.00 | රු. 500.00 |
| ව. මී. 5,001 ට වැඩි | රු. 600.00 | රු. 850.00 |
| | ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් එකතු වේ. | |
| 4. ලබාගත් තාවකාලික සහතිකය/ අර්ධ සහතිකයට පසුව අදාළ දේපළ ඉදිකිරීම අවසන් වූ පසු පූර්ණ සහතිකය ලබා ගත යුතු ය. | නියමිත ගාස්තුව | |
| ව. මී. 0 - 1000 දක්වා | රු. 2,000.00 | |
| ව. මී. 1,001 - ව. මී. 3,000 දක්වා | රු. 110,000.00 | |
| ව. මී. 3,001 - ව. මී. 5,000 දක්වා | රු. 150,000.00 | |
| ව. මී. 5,001 - ව. මී. 10,000 දක්වා | රු. 200,000.00 | |
| ව. මී. 10,001 - ව. මී. 20,000 දක්වා | රු. 250,000.00 | |
| ව. මී. 20,001 - ව. මී. 30,000 දක්වා | රු. 300,000.00 | |
| ව. මී. 30,001 - ව. මී. 40,000 දක්වා | රු. 350,000.00 | |
| ව. මී. 40,001 - ව. මී. 50,000 දක්වා | රු. 400,000.00 | |
| ව. මී. 50,001 ට වැඩි | රු. 450,000.00 | |
| | ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් එකතු වේ. | |
| 5. බස්නාහිර පළාත් මායිම් සීමාවෙන් පිටත ඉදිකරනු ලබන සහාධිපත්‍ය දේපළ සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව | ප්‍රවාහන ගාස්තු -<br>(i) සහාධිපත්‍ය ඒකක පහක් හෝ ඊට අඩු සහාධිපත්‍ය කොටස් සඳහා කිලෝ මීටරයකට රු. 12.00 බැගින්<br>(ii) සහාධිපත්‍ය ඒකක පහකට වැඩි සහාධිපත්‍ය කොටස් සඳහා කිලෝ මීටරයකට රු. 20.00 බැගින්,<br>ප්‍රවාහන ගාස්තුවට අමතරව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් ද එකතු වේ. | |
| 6. කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල ඉදිකරනු ලබන සහාධිපත්‍ය දේපළ සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව. | කොළඹ නගර සීමාවෙන් පිටත බස්නාහිර පළාත තුළ වූ ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල කෙරෙන ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා කිලෝ මීටරයකට රු. 20.00 ක ප්‍රවාහන ගාස්තුව සහ රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල්. | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | | |
|---|---|---|
| 7. අර්ධ හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් අලුත් කිරීම. (වාර්ෂිකව) | නියමිත ගාස්තුව<br>ව. මී. 1 කට | |
| | ව. මී. 1,000.00 දක්වා | රු. 2,000.00 |
| | ව. මී. 1,001 සිට ව. මී. 3,000 දක්වා | රු. 7,500.00 |
| | ව. මී. 3,001 සිට ව. මී. 5,000 දක්වා | රු. 15,000.00 |
| | ව. මී. 5,001 සිට ව. මී. 10,000 දක්වා | රු. 20,000.00 |
| | ව. මී. 10,001 ට වැඩි | රු. 25,000.00 |
| | ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් එකතු වේ. | |
| 8. ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළක යම් සංශෝධනයක් කර ඇතත් පෙර සැලසුම් ගාස්තුව අයකරන ලද වර්ග මීටර් ප්‍රමාණය වෙනස් නොවන අවස්ථාවල දී නාමික ගාස්තුවක් අයකිරීම. | නියමිත ගාස්තුව | |
| | සහාධිපත්‍ය ඒකක ගණන | ගාස්තුව |
| | ඒකක 05 ට අඩු | රු. 1,000.00 |
| | ඒකක 06 සිට 10 දක්වා | රු. 2,500.00 |
| | ඒකක 11 සිට 20 දක්වා | රු. 5,000.00 |
| | ඒකක 21 සිට 30 දක්වා | රු. 15,000.00 |
| | ඒකක 31 සිට 40 දක්වා | රු. 25,000.00 |
| | ඒකක 41 සිට 50 දක්වා | රු. 30,000.00 |
| | ඒකක 50 ට වැඩි | රු. 50,000.00 |
| | ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් එකතු වේ. | |
| 9. තාවකාලික හෝ අර්ධ සහාධිපත්‍ය සහතිකයක් සඳහා පෙරසැරි ගාස්තුව. | අවසන් සහතිකය ලබා ගන්නා අවස්ථාවේදී ගෙවීමට නියමිත ගාස්තුවෙන් 50% ක ගාස්තුවක් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු ය. ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල්ද එකතු වේ. | |
| 10. නිකුත් කළ සහතිකවල සත්‍ය පිටපතක් ලබා ගැනීම සඳහා | රු. 1,500.00<br>ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් එකතු වේ. | |

2. පාර්ශවයන් විසින් (නීතියේ විධිවිධානවලට අනුකූලව)සහාධිපත්‍ය දේපළක පැවැත්ම අවසන් කිරීම සඳහා/ කඩා ඉවත් කිරීම සඳහා අධිකාරියේ එකඟතාවය ලබා ගැනීමට ඉල්ලුම්කිරීමේ දී ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය පහත පරිදිවේ. (රජයේ අනුමත බදු වලට යටත්ව.)

| සහාධිපත්‍ය දේපළක පැවැත්ම අවසන්කිරීම/ කඩා ඉවත්කිරීම සඳහා පාර්ශවකරුවන් අධිකාරියේ එකඟතාවය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරන ලද අවස්ථාවකදී ඒ සඳහා ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය. | | |
|---|---|---|
| සහාධිපත්‍ය දේපළක් ලෙස ලියාපදංචි වූ ගොඩනැගිල්ලක් සඳහා සහාධිපත්‍ය පාර්ශවකරුවන් විසින් අධිකාරියේ එකඟතාවය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කළ අවස්ථාවක අයකරන ගාස්තුව | නියමිත ගාස්තුව | |
| | සහාධිපත්‍ය ඒකක ගණන | ගාස්තුව |
| | ඒකක 2 සිට 5 දක්වා | රු. 2,000.00 |
| | ඒකක 6 සිට 10 දක්වා | රු. 5,000.00 |
| | ඒකක 11 සිට 25 දක්වා | රු. 7,500.00 |
| | ඒකක 26 ට වැඩි | රු. 15,000.00 |
| | ඉහත ගාස්තුවට අතිරේකව රජය විසින්පනවනු ලබන වෙනත් බදු මුදල් ද එකතු වේ. | |

| | නියමිත ගාස්තුව |
|---|---|
| ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව | බස්නාහිර පළාතෙන් පිටත පවතින දේපළ පරීක්ෂා කිරීමට අවශ්‍ය වූ අවස්ථාවල දී ප්‍රවාහන ගාස්තු වශයෙන් කිලෝ මීටර් එකකට රු. 30.00 බැගින් වූ ප්‍රවාහන ගාස්තුවක් අයකරනු ලැබේ. (ගමනාගමන පහසුකම් සැපයීමේ දී අදාළ නොවේ.)<br><br>සහාධිපත්‍ය දේපළ කොළඹ නගර සීමාවෙන් පිටත බස්නාහිර පළාත තුළවූ අවස්ථාවක ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු ලෙස රු. 7,500.00 ක ගාස්තුවක් අය කෙරේ.<br><br>මෙම ගාස්තුවට අතිරේකව රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් ද එකතු වේ. |

07 - 579/1

එල්. ඩී. බී. 05/2016

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත**

2003 අංක 39 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ 24 වන වගන්තිය යටතේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

2017 ජුනි මස 27 දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 අංක 01 දරන සහාධිපත්‍ය දේපළ (කළමනාකරණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1 වන කොටස**

**සහතිකපත් නිකුත් කිරීම**

2. (1) (මෙහි මින් මතු "අධිකාරිය") යනුවෙන් සඳහන් කරනු ලබන සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කරනු ලබන පොදු පහසුකම් හා පොදු අංගෝපාංග පිළිබඳ සහතිකයක් සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන යම් සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් පනතේ 3අ(2)(එ) වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් මෙහි 1 වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.

(2) පොදු පහසුකම් හා පොදු අංගෝපාංග පිළිබඳ සහතිකයක් සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන යම් තාවකාලික සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් පනතේ 3ආ(2)(ඊ) වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් මෙහි 2 වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.

(3) පොදු පහසුකම් හා පොදු අංගෝපාංග පිළිබඳ සහතිකයක් සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන යම් අර්ධ සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් පනතේ 3ඇ(2)(ඊ) වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් මෙහි 3 වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.

3. (1) 2 වන නියෝගය යටතේ සකස් කරනු ලබන යම් ඉල්ලුම් පත්‍රයක් අයිතිකරු විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර -

(අ) ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවකු විසින් සකස් කර සහතික කරන ලද අදාළ සහාධිපත්‍ය දේපළ, තාවකාලික සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය පිඹුර ;

(ආ) අදාළ ක්ෂේත්‍රයේ නිසි සුදුසුකම්ලත් තැනැත්තන් විසින් අත්සන් කළ යුතු පොදු පහසුකම් වලට අදාල සේවා සහ සැලසුම් පිළිබඳ වාර්තාවක් ;

(ඇ) අදාළ පළාත් පාලන ආයතනය හෝ සැලසුම් බලධාරීන් විසින් අනුමත කරන ලද අදාළ ගොඩනැගිලි සැලැසුම ;

(ඈ) තාවකාලික සහාධිපත්‍ය දේපළ කොටසක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ කොටසක් සම්බන්ධ ඉල්ලුම් පත්‍රයක් වන විට, ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වන වලංගු ගොඩනැගිලි බලපත්‍රයක් ;

(ඉ) සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් වන විට, සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ල සඳහා ලබාගත් අනුකූලතා සහතිකයක් ;

(ඊ) සිවිල් සේවා ව්‍යුහ ඉංජිනේරුවරයෙකු විසින් සහතික කළ යුතු ගොඩනැගිල්ලේ ව්‍යුවහාත්මක සැලසුම සහ සහතිකය ;

(උ) සහාධිපත්‍ය දේපලේ රක්ෂණ සහතිකය ;

(ඌ) ඉල්ලුම් පත්‍රයේ වස්තුවිෂයයට අදාළ හිමිකම් වාර්තාවක් ; සහ

(එ) අධිකාරිය විසින් අවශ්‍ය කරනු ලැබිය හැකි වෙනත් යම් ලියකියවිලි,

සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඉහත (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සියලුම ලේඛන පිටපත් තුනකින් සමන්විත විය යුතුය.

(3) (1) ඡේදයේ (ආ) උපඡේදයේ සඳහන් කර ඇති අදාළ ක්ෂේත්‍රයන්හි නිසි සුදුසුකම් සහිත තැනැත්තන් කවුරුන් ද යන්න මෙහි 4 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇත.

4. 2 වන නියෝගය යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම් පත්‍රයක් සලකා බැලීමේ කාරණය සඳහා ඉහත නියෝගයේ සඳහන් කරනු ලැබූ ලියකියවිලිවලට අමතරව අයිතිකරු විසින්, යෝජිත සංවර්ධන කටයුතු වල යෝග්‍යතාව පිළිබඳ අධිකාරියට සෑහිමට පත් වීම සඳහා අවශ්‍ය යැයි අධිකාරිය විසින් සලකනු ලැබිය හැකි දේපළෙහි ඉදිරි නඩත්තු කටයුතු පිළිබඳව සකස් කරන ලද සැලසුම් දක්වන සහතික කරන ලද තොරතුරු සහ වෙනත් සැලසුම් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. 2 වන නියෝගය යටතේ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරන ලද සහාධිපත්‍ය පිඹුර, තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර -

(අ) බලපත්‍රලත් හෝ බලයලත් මිනින්දෝරුවකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් එම කාර්යය සඳහා නිසි බලය ලබා දුන් තැනැත්තකු විසින් සකස් කොට සහතික කර තිබිය යුතු ය ;

(ආ) පනතේ සහ මේ නියෝගවල විධිවිධානවල නියමයන්ට අනුකූල විය යුතු ය ;

(ඇ) පහත අනුපිළිවෙළට විය යුතු ය :-

(i) පිට කවරය;

(ii) පටුන;

(iii) සිතියමේ සංකේත විස්තර සටහන සහිතව ඉඩම සහ ගොඩනැගිල්ල පෙන්නුම් කරනු ලබන මිනින්දෝරු පිඹුර;

(iv) ගොඩනැගිලි වර්ගය සහ ගොඩනැගිල්ලේ භාවිතය සහ හිමිකම් පිළිබඳ විස්තර;

(v) මායිම් සහිතව සහාධිපත්‍ය කොටස්, අතිරේක කොටස් සහ පොදු අංගෝපාංග පෙන්නුම් කරන්නා වූ ද අවශ්‍ය විස්තර සහිත වූ ද මහල් පිළිබඳ සැලැස්ම;

(vi) එම සහාධිපත්‍ය දේපළෙහි මායිම්, වරිපනම් අංකය, මායිම් විස්තර, වර්ග ප්‍රමාණය සහ කොටස් අගයෙහි ප්‍රතිශතය ඇතුලත් උපලේඛනය ;

(vii) පොදු අංගෝපාංග පිළිබඳ ලැයිස්තුව;

(viii) එක් එක් කොටස සඳහා වන මිනුම් සැලැස්ම;

(ix) සිරස් හරස්කඩ; සහ

(x) අධිකාරිය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් යම් විස්තර.

6. සහාධිපත්‍ය පිඹුර, තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර සකස් කිරීමේ දී පහත අවශ්‍යතා හා අනුකූල විය යුතු ය:-

(අ) පිඹුර පිටපත් තුනකින් යුක්ත විය යුතු අතර අවස්ථාවෝචිත පරිදි එම පිඹුරේ මුල් පිටුවෙහි "මුල් පිටපත","දෙවන පිටපත" සහ "තුන්වන පිටපත" යන වචන පැහැදිලිව කියවිය හැකි පරිදි සටහන් කළ යුතු ය ;

(ආ) පිඹුරේ සෑම පිටුවකම ඉහළ දකුණු පස කෙළවරේ අවස්ථාවෝචිත පරිදි "සහාධිපත්‍ය පිඹුර", "තාවකාලික සහාධිපත්‍ය පිඹුර", "අර්ධ සහාධිපත්‍ය පිඹුර", "නැවත බෙදා වෙන්කිරීම සඳහා වන පිඹුර" හෝ "ඒකාබද්ධ පිඹුර" යන වචන සමඟ පිඹුරේ අංකය සටහන් කළ යුතු අතර පිඹුරේ අරමුණ ද නිශ්චිතව දැක්විය යුතු ය;

(ඇ) පිඹුරේ සෑම පිටුවකම ඉහළ දකුණු කෙළවරේ පහත දැක්වෙන ආකාරයට අංකනය කළ යුතු ය ; පිටු 10ක් ඇති විට සෑම පිටුවක්ම මුල් පිටුවෙන් ආරම්භව 10 න් 1, 10 න් 2, 10 න් 3 ආදි වශයෙන් අංකනය කළ යුතු ය;

(ඈ) පිඹුර සම්මත "**A**" කඩදාසියක් භාවිතා කොට සකස් කල යුතු අතර එක් වෙළුමකට වඩා ඇත්නම් සහ පළමුවන වෙළුමේ පිටු 10ක් ඇත්නම් දෙවන වෙළුම අඛන්ඩ අංක 20න් 11 ලෙස ආරම්භ කළ යුතු ය.

(ඉ) පිඹුර මුද්‍රිත හෝ අතින් ලියන ලද කියවිය හැකි ප්‍රමාණයේ අකුරු වලින් විය යුතු අතර පිට කවරයක් හා පටුනකින් සමන්විත විය යුතු අතර කොල සැකසීමේ දී 5(1) නියෝගයේ දක්වා ඇති අනුපිළිවෙල හා සංයුක්ත විය යුතු ය. පිටුවක ගනකම වර්ග මීටරයකට ග්‍රෑම් 120 හෝ ඊට වැඩි විය යුතු ය (පිටුවක බර එක් වර්ග මීටරයකට ග්‍රෑම් 120 වඩා වැඩි විය යුතු ය.). පිඹුර ශක්තිමත්ව බඳින ලද පොතක ආකාරයට සකස් කළ යුතු ය. පිට කවරයේ, අරමුණ, පිඹුරේ අංකය සහ මිනින්දෝරුවරයාගේ ලිපිනය සහ අනිකුත් අදාල විස්තර මුද්‍රිතව හෝ අත් අකුරින් සටහන් කළ යුතු අතර යම් වෙළඳ දැන්වීම් හෝ පින්තූර ඇතුළත් නොවිය යුතු ය.

(ඊ) පිඹුර සකස් කරනු ලබන මිනින්දෝරුවරයා විසින් පිඹුරේ සෑම පිටුවක්ම අත්සන කළ යුතු අතර සිය මුද්‍රාව ද තැබිය යුතු ය.

7. සහාධිපත්‍ය පිඹුරක, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක යම් තොරතුරු පහත දැක්වෙන ආකාරයට පෙන්නුම් කළ යුතු ය:-

(i) සහාධිපත්‍ය කොටසක් කොටස් අභ්‍යන්තර ප්‍රවේශයක් සහිත මහල් දෙකකින් හෝ වැඩි ප්‍රමාණයකින් සමන්විත වන අවස්ථාවල, එක් එක් මහල් කොටස සම්බන්ධයෙන්, සැලැස්මේ ඉහළින් පිහිටි සහාධිපත්‍ය කොටසේ කොටස් "1 වන මහලේ කොටස", "2 වන මහලේ කොටස" ආදී වශයෙන් එක් එක් කොටස් මායිම් සහිතව දැක්විය යුතු අතර එහි භාවිතය 5(ඇ)(vi) නියෝගය යටතේ සකස් කරනු ලබන උපලේඛනයේ දැක්විය යුතු ය. සහාධිපත්‍ය කොටසේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය, එක් එක් සහාධිපත්‍ය කොටසෙහි විස්තර සහිතව ගණනය කළ යුතු අතර අදාළ කොටසෙහි වටිනාකමෙහි ප්‍රතිශතය ද දැක්විය යුතු ය;

(ii) සහාධිපත්‍ය දේපළ ඉදිකළ විට අදාළ සහාධිපත්‍ය පිඹුරේ ගොඩනැගිල්ලේ මතුපිට මායිම් දක්වනු ලබන රේඛාංකනයට අමතරව ගොඩනැගිල්ලට පිටතින් ඉඩමේ මායිම තුල පිහිටි පොදු කානු, අපජල වළවල් සහ පූතික වළවල් ආදී සියළු පොදු අංගෝපාංග දැක්විය යුතු ය. පවත්නා ගොඩනැගිල්ලකින් යෝජිත ගොඩනැගිල්ලක් වෙන් කොට හඳුනා ගත හැකි වන පරිදි සලකුණු යොදා තිබිය යුතු ය ;

(iii) සෑම ගොඩනැගිල්ලක් සඳහා ම සිරස් හරස්කඩක් ඇඳිය යුතු අතර එහි පරිමානය 1:100 හෝ 1:200 විය යුතු අතර මහල් දෙකක් අතර උස සහ එක් එක් පොළවේ ඝනකම දැක්විය යුතු ය ;

(vi) සහාධිපත්‍ය කොටසක දළ වර්ග ප්‍රමාණය ගණනය කිරීමේ දී පිටත බිත්තිවල මධ්‍ය රේඛාව මායිම් සේ සැලකිය යුතු අතර එක් වර්ග මීටරයකට වැඩි කොන්ක්‍රීට් කණු, සේවා නළ සහ පොදු අවකාශ එම ගණනය කිරීමෙන් ඉවත් කළ යුතු ය ;

(v) ප්‍රධාන කොටසේ වර්ග ප්‍රමාණයට අතිරේක කොටසේ වර්ග ප්‍රමාණ එකතු කිරීම මගින් කොටස් වටිනාකමේ ප්‍රතිශතය සහ කොටස් වටිනාකම ගණනය කළ යුතු ය. අතිරේක කොටස්වල සහ සහාධිපත්‍ය කොටසේ වර්ග ප්‍රමාණය සහ මායිම් වෙන් වෙන් ව උපලේඛනයේ ලකුණු කළ යුතු ය ;

(vi) සම්පූර්ණ කරන ලද හෝ යෝජිත සහාධිපත්‍ය ගොඩනැගිල්ලක අනුමත ගොඩනැගිලි සැලැස්මේ දක්වා ඇති ඉඩමේ මායිම් සහ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති ඉඩමේ මායිම් අනන්‍ය විය යුතු ය ;

(vii) තාවකාලික සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් හෝ අර්ධ සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් සහාධිපත්‍ය පිඹුරක් ඉදිරිපත් කරනු ලබන විට ගොඩනැගිලි බලපත්‍රයේ වලංගුභාවය කල් ඉකුත් නොවී පැවතිය යුතු අතර අනුමත ගොඩනැගිලි බලපත්‍රයේ අංකය සහ දිනය සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කරනු ලැබිය යුතු ය**;**

(viii) නේවාසික අරමුණු සහ වෙනත් යම් අරමුණක් වැනි මිශ්‍ර අරමුණු උදෙසා සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් භාවිතා කරනු ලබන අවස්ථාවක, ගොඩනැගිල්ලේ භාවිතයට අවහිර නොවන පරිදි විශේෂ අංක සහිත වෙන් වූ වාහන ගාල් කිරීමේ ප්‍රදේශ වෙන් ව සීමාංකනය කළ යුතු ය ;

(ix) අර්ධ සහාධිපත්‍ය සැලැස්මක දක්වා ඇති ගොඩනැගිලි ස්ථිර රේඛා වලින් දැක්විය යුතු අතර යෝජිත කොටස් කඩඉරි වලින් හෝ වෙනත් යම් ක්‍රමවේදයක් භාවිතා කොට ගොඩනැගිල්ල පහසුවෙන් හඳුනාගත හැකි ආකාරයට දැක්විය යුතු ය ;

(x) එක් එක් කොටසේ පිහිටීම අනුව සහ මහලට අදාළව වෙන්කොට දෙන ලද එක් එක් විශේෂ අංක, වරිපනම් අංකයක් වේ නම් එම වරිපනම් අංකය, මහලේ හෝ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍ය රේඛාවට අදාලව දක්වා ඇති පැති හයෙහි මායිම් විස්තර, කොටසෙහි වර්ග ප්‍රමාණය, වර්ග ප්‍රමාණයෙහි කොටස් වටිනාකමෙහි ප්‍රතිශතය, ආසන්නතම යාබද පොදු ප්‍රවේශය සහ පොදු අංගෝපාංග පිළිබඳ විස්තර හඳුනාගැනීම පහසුවන පරිදි සළකුණු කර එක් එක් කාමරයේ අරමුණු සමග පිඹුරේ ඇතුළත් කළ යුතු ය.

(xi) සහාධිපත්‍ය පිඹුරක් සකස් කිරීමේ දී ආබාධිත තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ වන නීති ද සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(xii) ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක් සංශෝධනය කිරීමේ දී, පූර්ව ලියාපදිංචි පිඹුරේ සඳහන් කර ඇති කොටස් වටිනාකම සහ සංශෝධිත පිඹුරේ සඳහන් කර ඇති කොටස් වටිනාකම වෙන් වූ තීරුවල, පිළිවෙළින් රතු සහ කළු වර්ණයෙන්, විවිධ වටිනාකම් පහසුවෙන් හඳුනා ගත හැකිවන පරිදි දැක්විය යුතු ය.

(xiii) උපකාරක කොටස්වල, මායිම් සහ අනෙකුත් කොටස්වලට ප්‍රවේශ පහසුකම නොමැති සහ ප්‍රධාන කොටසේ භාවිතයට පමණක් සීමා වූ සහ යාබදව පිහිටා ඇති ආවරණය කරන ලද සඳළුතල සහ සැලැස්මේ විස්තර කර ඇති සහාධිපත්‍ය කොටසේ පිටත මායිම්, උපලේඛනයේ උපකාරක කොටස් වශයෙන් වෙන් ව දැක්විය යුතු අතර ප්‍රධාන කොටසේ වර්ග ප්‍රමාණයට එක් කළ යුතු අතර ම කොටස් වටිනාකමේ ප්‍රතිශතය ඒ අනුව ගණනය කරනු ලැබිය යුතු ය.

(xix) සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහාධිපත්‍ය දේපළේ අයිතිකරුගේ වගකීම විය යුතු ය.

## II වන කොටස

### අවකාශය වෙන්කිරීම

8. සහාධිපත්‍ය දේපළක අවකාශය වෙන්කිරීම සැලසුම් කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) සහාධිපත්‍ය දේපළක කොටස් පහක් හෝ වැඩි ප්‍රමාණයක් ඇති විට, කළමනාකරණ සංස්ථාව වෙනුවෙන් ඉඩක් වෙන් කරනු ලැබිය යුතු ය. කාර්යාලයක් වශයෙන් සහ උපකරණ තබා ගැනීම සඳහා කාමරයක් තිබිය යුතු ය.

(ආ) යම් අදාළ කාර්යයන් සඳහා සහාධිපත්‍ය දේපළක්, අර්ධ සහාධිපත්‍ය දේපළක් හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළක් විකිණීම සඳහා ගිවිසුමක් අත්සන් කිරීමේ දී එම කොටසේ වර්ග ප්‍රමාණය, බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සකස් කරන ලද සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති වර්ග ප්‍රමාණයට සමාන විය යුතු ය.

(ඇ) යම් සහාධිපත්‍ය කොටසක හෝ එහි කොටසක අනුමත කාර්යය වෙනස් කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟුන විටෙක අධිකාරියේ සමගාමීත්වය සහිතව සැලසුම් කිරීමේ අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබා ගත යුතු ය.

(ඈ) ප්‍රධාන ජල සැපයුම් පද්ධතිය/ජලය රැස් කිරීමේ ටැංකි සඳහා විධිවිධාන සැලසීම ජාතික ජල සම්පාදනය හා ජලාපවාහන මණ්ඩලයේ නියමයන් හා අනුකූල විය යුතු ය.

(ඉ) විදුලි හා ජල මීටර්, පොදු අංගෝපාංග පිහිටා ඇති ස්ථානයක ආරක්ෂිතව ස්ථාන ගත කළ යුතු ය.

(ඊ) සහාධිපත්‍ය දේපළෙහි එක් එක් කොටසේ සේවා නළ මාර්ග වෙනත් ඒකක හරහා සපයන අවස්ථාවක එම අවකාශය පොදු අංගෝපාංගයක් ලෙස සහාධිපත්‍ය සැලැස්මේ දැක්විය යුතු ය.

(උ) පොදු වහල හේතුවෙන් ඇතිවන රස්නය පාලනය කිරීමට හැකිවන යම් ආකාරයකට වහලේ රස්නය පාලනයට කටයුතු සැලැස්විය යුතු ය.

(ඌ) විදුලි සෝපානය සහ පොදු ලාම්පු සඳහා ස්වයංක්‍රීය ස්විචයක් මගින් දැල්වීම කරනු ලැබිය යුතු සරිලන ධාරිතාවයකින් යුතු ජෙනරේටරයක් ස්ථාපනය කළ යුතු ය.

(එ) නේවාසික කොටස් සඳහා ප්‍රවේශය සපයන යම් ගෙතුල්මගක් මීටර් 1.5 ක අවම පළලින් යුක්ත විය යුතු ය.

(ඒ) සඳළුතල බිත්තිවල උස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව විය යුතු ය.

(ඔ) වර්ග ප්‍රමාණය වර්ග අඩි 5000ක් හෝ මහල් පහක් ඉක්මවා ඇති ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට රජය විසින් අනුමත පිළිගත් ආයතනයකින් පාංශු පිළිබඳ සහතිකයක් ලබා ගත යුතු ය.

(ඕ) යම් කොන්ත්‍රාත්කරුවකු වගකීම් කාල සීමාව තුළ සහාධිපත්‍ය දේපළ සම්බන්ධව වගකීම් සහතිකයේ නියම සපුරාලීමට අපොහොසත්වන අවස්ථාවක, දේපළේ අයිතිකරු එම වගකීම ඉටු කිරීමට බැඳී සිටිය යුතු ය.

## III වන කොටස

### මූලික සැලසුම් නිරාකරණය

9. සහාධිපත්‍ය දේපළ සංවර්ධනය සඳහා අවශ්‍ය කරනු ලබන මාර්ගෝපදේශ ලබා ගැනීම පිණිස අධිකාරියෙන් ලබාගත්, 5 වන උපලේඛනයේ ආකෘතිය ප්‍රකාරව වූ අයදුම් පත්‍රයක් හා අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් මූලික සැලසුම් නිරාකරන ලිපියක් ලබා ගත යුතු ය.

10. මූලික සැලසුම් නිරාකරන ලිපියේ වලංගු කාලය වර්ෂ තුනකි.

## IV වන කොටස

### සහාධිපත්‍ය දේපළ සහ කොටස් පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

11. යම් සහාධිපත්‍ය දේපළක් හෝ සහාධිපත්‍ය කොටසක් කළමනාකරණය කිරීමේ දී පහත කරුණු හා අනුගත වී ඇති බව යම් කළමනාකරණ සංස්ථාවක් විසින් සහතික වීම එහි වගකීම විය යුතු ය:-

( අ) ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක වාහන ගාල් කිරීමේ ඉඩ පොදු අංගෝපාංගයක් ලෙස දක්වා ඇති විට සෑම පදිංචිකරුවකුට ම ඔහුගේ වාහනය ප්‍රථමයෙන් පැමිණි තැනැත්තාට ප්‍රථමයෙන් සේවා සැපයීමේ පදනම මත තම වාහන ගාල් කිරීමේ ඉඩ සඳහා පොදු අයිතියක් තිබේ.

(ආ) නිසි අයුරෙන් සකස් කරන ලද බදු ගිවිසුමකින් තොරව නේවාසික සහාධිපත්‍ය කොටසක කිසිදු අයිතිකරුවකු එම කොටස කෙටි කාලීන බද්දකට හෝ කුලියට තුන් වන පාර්ශවයකට නොදිය යුතු ය.

(ඈ) සහාධිපත්‍ය ඒකකයක අභ්‍යන්තරයේ මළ කැමක් හෝ කාන්දු වීමක් ඇති වූ අවස්ථාවක, එම මළ කැමේ හෝ කාන්දු වීමේ ස්වභාවය තාක්ෂණික වාර්තාවක් මගින් හඳුනාගෙන ඇති විට, වගකිව යුතු පාර්ශවය විසින් එම මළ කැම හෝ කාන්දුව පිළිසකර කරනු ලැබිය යුතු අතර එසේ එම පාර්ශවය එය පිළිසකර කිරීමට අපොහොසත් වන්නේ නම් කළමනාකරණ සංස්ථාව විසින් එය පිළිසකරකොට, පිළිසකර කිරීමේ පිරිවැය එම පාර්ශවයෙන් අයකරගනු ලැබිය යුතු ය.

(ඇ) සහාධිපත්‍ය කොටසක් සහාධිපත්‍ය කොටසේ අනෙකුත් පදිංචිකරුවන්ට පොදු අංගෝපාංග භාවිත කිරීමට අවහිර වන යම් ආකාරයකට හෝ එහි අනෙකුත් පදිංචිකරුවන්ට අපහසුතා ඇතිවන ආකාරයට හෝ කිසිදු තැනැත්තකු විසින් භාවිත කරනු නොලැබිය යුතු ය.

(ඉ) සහාධිපත්‍ය දේපළක විදුලි සෝපාන ක්‍රියාවේ යෙදවීමට සුදුසු තැනැත්තකු විශේෂයෙන් ම නියම කිරීම කළමනාකරණ සංස්ථාව විසින් අනිවාර්යයෙන් ම කළ යුතු ය. එසේ නැත්නම් පාලක කුටියේ සිට **CCTV** කැමරා මගින් විදුලි සෝපානයේ ඇතුළත නිරීක්ෂණය කළ හැකි නිලධරයකු පාලන කුටියට විශේෂයෙන් ම නියම කළ යුතු ය.

(ඊ) කළමනාකරණ සංස්ථාව විසින් ගිනි නිවීමේ උපකරණ නඩත්තු කිරීම අඛණ්ඩ ව කළ යුතු අතර ඒවා ක්‍රියාකාරීත්වයෙන් බැහැර නොවන බවට වග බලා ගත යුතු ය.

(උ) කළමනාකරණ සංස්ථාව විසින් කළමනාකරණ ගාස්තු අයකරනු ලැබ ඇත්තේ සමාන වාරික වශයෙන් නම්, කළමනාකරණ සංස්ථාව විසින් මේ නියෝගවල දිනයේ සිට සහාධිපත්‍ය කොටස් වටිනාකමට සමානුපාතිකව කළමනාකරණ ගාස්තු අයකර ගත යුතු ය.

(ඌ) සහාධිපත්‍ය දේපළක් ලියාපදිංචි නොකිරීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් අධිකාරිය ඉදිරියේ විභාග වෙමින් පවතින අවස්ථාවක කිසිදු තැනැත්තකු විසින් අධිකාරියේ අනුමතයෙන් තොරව වෙනත් කිසිදු සහාධිපත්‍ය කොටසක් විකිණීම, උකසට දීම හෝ කුලියට දීම කරනු නොලැබිය යුතු ය.

(එ) සහාධිපත්‍ය දේපළවල සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමෙන් අනතුරු ව ගැනුම්කරුවන්ට සහාධිපත්‍ය කොටස්වල හිමිකම් ඔප්පු නිකුත් කරනු ලැබ නොමැති අවස්ථාවක, දේපළක අයිතිකරුට අනාගතයෙහි බලාපොරොත්තු විය හැකි ගැනුම්කරුවන්ගේ අයිතිවාසිකම් වලට බලපෑම් ඇති කළ හැකි කිසිදු රීතියක් රැස්වීමක දී සෑදීමට කිසිදු බලයක් නොවිය යුතු ය.

## V වන කොටස

### විවිධ

12. සහාධිපත්‍ය දේපළකට අදාළ පළාත් පාලන ආයතනය මගින් අනුකූලතා සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තේ නම් මිස කිසිදු තැනැත්තකු විසින් යම් සහාධිපත්‍ය දේපළක පදිංචි වීම කරනු නොලැබිය යුතු ය.

13. මේ පනතේ "පනත" යන්නෙන් 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත අදහස් වේ.

2(1) වන නියෝගය

### *1 වන උපලේඛනය*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

අංකය : .................................. ලැබූ දිනය : ...............................

මුදල් ගෙවූ දිනය : ........................................................................

පෙරසැරි ගාස්තුව : .......................................................................

පරීක්ෂා කලේ : ........................ මුදල් බිල්පතේ අංකය : .............

.................................. .....................................

නම අත්සන

## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය දේපළක් සඳහා වන පොදු පහසුකම් හා පොදු අංගෝපාංග පිළිබඳ සහතිකය සඳහා වන අයදුම්පත

1. අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ නම/නම් : ..........................................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය/සමාගම් ලියාපදිංචි අංකය : ..........................................................................................
..........................................................................................
3. ලිපිනය : ..........................................................................................
4. විද්‍යුත් ලිපිනය : ..........................................................................................
5. දුරකථන අංකය : ..........................................................................................
6. සහාධිපත්‍ය දේපළෙහි නම : ..........................................................................................
7. සහාධිපත්‍ය දේපළෙහි ලිපිනය : ..........................................................................................
8. සහාධිපත්‍ය කොටස් ගණන:
   - I. නේවාසික -
   - II. වාණිජ -
9. සහාධිපත්‍ය දේපළෙහි වර්ග ප්‍රමාණය (ව.මී.) :
   - I. මිනින්දෝරුවරයාගේ නම -
   - II. සහාධිපත්‍ය පිඹුරු අංකය -
10. සමාගමක් වන විට සමාගමේ විස්තර : ..........................................................................................
11. ඉඩම් හිමිකම් ඔප්පුව : ..........................................................................................
12. ව්‍යාපෘතිය සඳහා ණයක් ලබාගෙන ඇත්නම් උකස්කර සහ අනිකුත් බැඳීම් පිළිබඳ විස්තර : ..........................................................................................
..........................................................................................
13. විකිණුම් ගිවිසුම් පිළිබඳ විස්තර සහ සහාධිපත්‍ය කොටස් අයිතිකරුවන්ගේ විස්තර : ..........................................................................................
..........................................................................................
14. සහාධිපත්‍ය සැලැස්ම ලියාපදිංචි කිරීමට අදහස් කරන කාල සීමාව : ..........................................................................................
15. ඇමුණුම්

| | | යොමු අංකය | දිනය |
|---|---|---|---|
| (I) | අවසන් වරට නගර සභාව/ මහනගර සභාව/ ප්‍රාදේශීය සභාව/ මගින් අනුමත කල සංශෝධන සමග ගොඩනැගිලි සැලසුම සහ (මුල් පිටපත සහ වාස්තු විද්‍යාඥයෙකු හා වරලත් ව්‍යුහාත්මක ඉංජිනේරුවෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතු පිටපත් 2ක්) | | |

| | | යොමු අංකය | දිනය |
|---|---|---|---|
| (II) | සහාධිපත්‍ය පිඹුර (මුල් පිටපත/දෙවන පිටපත/තුන්වන පිටපත) | | |

| | | යොමු අංකය | දිනය |
|---|---|---|---|
| (III) | අදාළ පළාත් පාලන ආයතනය මගින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකය (මුල් පිටපත සහ පිටපත් දෙකක්) | | |

| | | යොමු අංකය | දිනය |
|---|---|---|---|
| (IV) | ඉඩමේ හිමිකම් ඔප්පුව (මුල් පිටපත සහ පිටපත් දෙකක්) | | |

| | | යොමු අංකය | දිනය |
|---|---|---|---|
| (V) | නඩත්තු පිළිබඳ කළමනාකරණ යෝජනා (සමාගමක් වන විට අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කරනු ලැබ තිබිය යුතු ය.) | | |

VI. ඉදිකිරීමට අදාළ පහත විස්තරඃ

(අ) ජල සැපයුම, සැපයුම සඳහා සැලසුම;
(ආ) අපජලය බැහැර කිරීම පිළිබඳ සැලැසුම;
(ඇ) මලපවහනය පිළිබඳ සැලැස්ම;
(ඈ) වැහිවතුර බැහැර කිරීම;
(ඉ) කුණු කසළ කළමනාකරණය පිළිබඳ සැලැසුම;
(ඊ) විදුලි සැපයුම සඳහා සැලසුම;
(උ) දුරකථන පහසුකම් සැපයුම පිළිබඳ සැලැසුම;
(ඌ) විදුලි සෝපාන සැපයීම පිළිබඳ සැලැසුම;
(එ) ගිනි ආරක්ෂණය සැපයීම පිළිබඳ සැලැසුම;
(ඒ) ව්‍යුහගත සැලසුම්;
(ඔ) වෙනත් සේවාවන් සඳහා සැලැසුම ;

සියලු සැලසුම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් අත්සන් කර තිබිය යුතු ය.

මම/අපි ඉදිරිපත් කරන තොරතුරු සත්‍ය බවට සහතික වෙමි/වෙමු.

| ................................................ | ................................................ | ................................................ |
|---|---|---|
| අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ අත්සන | වරලත් ඉංජිනේරුවරයාගේ/ වාස්තු විද්‍යාඥවරයාගේ අත්සන | ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ අත්සන |
| දිනය ................................ | දිනය ................................ | දිනය ................................ |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

වෙනත් සඳහන් කිරීම්

2(2) වන නියෝගය

*2 වන උපලේඛනය*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

අංකය : ................................ ලැබූ දිනය : ..............................

මුදල් ගෙවූ දිනය : .......................................................................

පෙරසැරි ගාස්තුව : .......................................................................

පරීක්ෂා කලේ : ........................ මුදල් බිල්පතේ අංකය : .............

................................. .....................................

නම අත්සන

## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

තාවකාලික සහාධිපත්‍ය දේපළක් සඳහා වන පොදු පහසුකම් හා පොදු අංගෝපාංග පිළිබඳ සහතිකය සඳහා වන අයදුම්පත

1. අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ නම/නම් : ..................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය/ සමාගම් ලියාපදිංචි අංකය : ..................................................
..................................................
3. ලිපිනය : ..................................................
4. විද්‍යුත් ලිපිනය : ..................................................
5. දුරකථන අංකය : ..................................................
6. තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි නම : ..................................................
7. තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි ලිපිනය : ..................................................
8. සහාධිපත්‍ය කොටස් ගණන : ..................................................
9. තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි වර්ග ප්‍රමාණය (ව.මී.) : ..................................................
10. ඇමුණුම්

(i) අවසන් වරට නගර සභාව/මහ නගර සභාව/ ප්‍රාදේශීය සභාව මගින් සංශෝධන සමග අනුමත කළ ගොඩනැගිලි සැලසුම.

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(ii) තාවකාලික සහාධිපත්‍ය පිඹුර (මුල් පිටපත/දෙවන පිටපත/ තුන්වන පිටපත)

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(iii) 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ නියම ප්‍රකාරව සුදුසුකම්ලත් තැනැත්තකු විසින් සකස්කොට අත්සන් කරන ලද ඉදිකිරීම් පිළිබඳ යෝජිත සංවර්ධන වැඩසටහන

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(iv) ඉඩම් හිමිකම් ඔප්පුව (මුල් පිටපත හා පිටපත් දෙකක්)

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(v) නඩත්තුව පිළිබඳව කළමනාකරණ යෝජනා (සමාගමක් වන විට අධ්‍යක්ෂකවරුන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබ තිබිය යුතු ය.)

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(vi) ඉදිකිරීමට අදාල පහත විස්තරඃ

(අ) ජල සැපයුම පිළිබඳ සැලසුම;
(ආ) අපජලය බැහැර කිරීම පිළිබඳ සැලැසුම;
(ඇ) මලපවහනය පිළිබඳ සැලැස්ම;
(ඈ) වැහිවතුර බැහැර කිරීම;
(ඉ) කුණු කසළ කළමනාකරණය පිළිබඳ සැලැසුම;
(ඊ) විදුලි සැපයුම පිළිබඳ සැලසුම;
(උ) දුරකථන පහසුකම් සැපයුම පිළිබඳ සැලැසුම;
(ඌ) විදුලි සෝපාන සැපයීම පිළිබඳ සැලැසුම;
(එ) ගිනි ආරක්ෂණය සැපයීම පිළිබඳ සැලැසුම;
(ඒ) වෙනත් සේවාවන් සඳහා සැලැසුම්;

මේ සියලු සැලසුම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් අත්සන් කර තිබිය යුතු ය.

මම/අපි ඉදිරිපත් කරන තොරතුරු සත්‍ය බවට සහතික වෙමි/වෙමු.

| | | |
|---|---|---|
| ................................................ | ................................................ | ................................................ |
| අයිතිකරුගේ/අයිතිතරුවන්ගේ අත්සන | වරලත් ඉංජිනේරුවරයාගේ/ වාස්තු විද්‍යාඥවරයාගේ අත්සන | ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ අත්සන |
| දිනය ................................ | දිනය ................................ | දිනය ................................ |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

වෙනත් සඳහන් කිරීම්

2(3) වන නියෝගය

*3 වන උපලේඛනය*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

අංකය : ................................. ලැබූ දිනය : ..............................

මුදල් ගෙවූ දිනය : ........................................................................

පෙරසැරි ගාස්තුව : ........................................................................

පරීක්ෂා කලේ : ........................ මුදල් බිල්පතේ අංකය : .............

................................. ......................................

නම අත්සන

**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය**

අර්ධ සහාධිපත්‍ය දේපලක් සඳහා වන පොදු පහසුකම් හා පොදු අංගෝපාංග පිළිබඳ සහතිකය සඳහා වන අයදුම්පත

1. අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ නම/නම් : ..........................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය/ සමාගම් ලියාපදිංචි අංකය : ..........................................................
   ..........................................................
3. ලිපිනය : ..........................................................
4. විද්‍යුත් ලිපිනය : ..........................................................
5. දුරකථන අංකය : ..........................................................
6. අර්ධ සහාධිපත්‍ය දේපළෙහි නම : ..........................................................
7. අර්ධ සහාධිපත්‍ය දේපළෙහි ලිපිනය : ..........................................................
8. අර්ධ සහාධිපත්‍ය කොටස් ගණන: I. නේවාසික ..................................... II. වාණිජ ........................................
9. අර්ධ සහාධිපත්‍ය දේපළෙහි වර්ග ප්‍රමාණය (ව.මී.) : ..........................................................
   I. මිනින්දෝරුවරයාගේ නම : ............................................... II. අර්ධ සහාධිපත්‍ය පිඹුරේ අංකය : ......................
10. සහතිකලත් සමාගමේ විස්තර : ..........................................................
11. ඉඩමේ හිමිකම් ඔප්පුව : ..........................................................
12. ව්‍යාපෘතිය සඳහා යම් ණයක් ලබාගෙන ඇත්නම් උකස්කර සහ අනෙකුත් වගකීම් පිළිබඳ විස්තර ..........................
    ..........................................................
13. විකුණුම් ගිවිසුම් පිළිබඳ විස්තර සහ සහාධිපත්‍ය කොටස්වල හිමිකරුවන් පිළිබඳ විස්තර : ....................................
    ..........................................................
14. අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට අපේක්ෂිත කාලසීමාව : ..........................................................

15. ඇමුණුම්:

(i) අවසන් වරට මහ නගර සභා/ නගර සභා/ ප්‍රාදේශීය සභාව මගින් අනුමත කළ සංශෝධන සහිත වූ ගොඩනැගිලි සැලසුම (මුල් පිටපත් සහ වරලත් වාස්තු විද්‍යාඥයකු සහ වරලත් ව්‍යුහාත්මක ඉංජිනේරුවරයෙකු විසින් සහතික කළ පිටපත් දෙකක්)

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(ii) අර්ධ සහාධිපත්‍ය පිඹුර (මුල් පිටපත/දෙවන පිටපත/තුන්වන පිටපත)

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(iii) සම්පූර්ණ කරන ලද කොටස් සඳහා අනුකූලතා සහතිකය

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(iv) 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ නියමයන් ප්‍රකාරව සුදුසුකම්ලත් තැනැත්තකු විසින් සකස් කර අත්සන් කරන ලද ඉදිකිරීමට අදාල යෝජිත සංවර්ධන ක්‍රියාවලිය.

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(v) ඉඩමේ හිමිකම් ඔප්පුව (මුල් පිටපත හා පිටපත් දෙකක්)

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(vi) නඩත්තුව පිළිබඳ කළමනාකරණ යෝජනා (සමාගමක් වන විට අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර තිබිය යුතු ය.)

| යොමු අංකය | දිනය |
|---|---|
| | |

(vii) ඉදිකිරීමට අදාළ පහත විස්තරඃ

(අ) ජල සැපයුම පිළිබඳ සැලසුම;
(ආ) අපජලය බැහැර කිරීම පිළිබඳ සැලැසුම;
(ඇ) මලපවහනය පිළිබඳ සැලැස්ම;
(ඈ) වැහිවතුර බැහැර කිරීම පිළිබඳ සැලසුම;
(ඉ) කුණු කසළ කළමනාකරණය පිළිබඳ සැලැසුම;
(ඊ) විදුලි සැපයුම;
(උ) දුරකථන පහසුකම් සැපයුම පිළිබඳ සැලැසුම;
(ඌ) විදුලි සෝපාන සැපයීම පිළිබඳ සැලැසුම;
(එ) ගිනි ආරක්ෂණය සැපයීම පිළිබඳ සැලැසුම;
(ඒ) වෙනත් සේවාවන් සඳහා සැලැසුම.

සියලු සැලසුම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් අත්සන් කර තිබිය යුතු ය.

මම/අපි ඉදිරිපත් කරන තොරතුරු සත්‍ය බවට සහතික වෙමි/වෙමු.

| | | |
|---|---|---|
| ............................................. | ............................................. | ............................................. |
| අයිතිකරුගේ/අයිතිතරුවන්ගේ අත්සන | වරලත් ඉංජිනේරුවරයාගේ/ වාස්තු විද්‍යාඥවරයාගේ අත්සන | ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ අත්සන |
| දිනය ................................ | දිනය ................................ | දිනය ................................ |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

වෙනත් සඳහන් කිරීම්

3 (3) වන නියෝගය

*4 වන උපලේඛනය*

3 වන නියෝගයේ (3) වන ඡේදයේ දක්වා ඇති අදාළ සුදුසුකම්ලත් තැනැත්තන් පහත දක්වා ඇති පරිදි විය යුතු ය:-

(i) සහාධිපත්‍ය සැලැස්ම, අර්ධ සහාධිපත්‍ය සැලැස්ම හෝ තාවකාලික සහාධිපත්‍ය සැලැස්ම - ලියාපදිංචි මිනින්දෝරුවරයකු හෝ සර්වේයර් ජනරාල්වරයාගෙන් බලයලත් තැනැත්තා;

(ii) ගොඩනැගිල්ල පිළිබඳ ව්‍යුහාත්මක සහතිකය හා සැලැස්ම - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ව්‍යුහාත්මක ඉංජිනේරුවරයකු ලෙස ලියාපදිංචි වූ වරලත් ව්‍යුහාත්මක ඉංජිනේරුවරයෙක්;

(iii) ගොඩනැගිල්ලට ජලය සැපයීමේ සැලැස්ම හා අදාළ සහතිකය - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත වරලත් සිවිල් ඉංජිනේරුවරයෙක්;

(iv) ගොඩනැගිල්ලේ අපජලය බැහැර කිරීම සැලැස්ම හා අදාළ සහතිකය - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත වරලත් සිවිල් ඉංජිනේරුවරයෙක්;

(v) ගොඩනැගිල්ලේ පල්දෝරු ක්‍රමය හා අදාළ සහතිකය - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත වරලත් සිවිල් ඉංජිනේරුවරයෙක්;

(vi) වැසිජලය බැස යාමේ සැලස්ම හා අදාළ සහතිකය - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත වරලත් සිවිල් ඉංජිනේරුවරයෙක්;

(vii) කසළ අපහරණය - අදාළ පළාත් පාළන ආයතනය අනුමත කරන ලද යෝජනාවලිය;

(viii) විදුලිය සැපයුම - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත ලියාපදිංචි වරලත් විදුලි ඉංජිනේරුවරයෙක්;

(ix) දුරකතන පහසුකම් සැපයුම - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත ලියාපදිංචි වරලත් විදුලි ඉංජිනේරුවරයෙක්;

(x) අකුණු සන්නායක - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත ලියාපදිංචි වරලත් විදුලි ඉංජිනේරුවරයෙක්;

(xi) විදුලි සෝපානය - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාවට අනුයුක්ත ලියාපදිංචි වරලත් විදුලි ඉංජිනේරුවයෙක් හෝ යාන්ත්‍රික ඉංජිනේරුවයෙක්;

(xii) ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ගිනි ආරක්ෂණ සහතිකය;

(xiii) ගැස් සැපයුම - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ගොඩනැගිලි සේවාව යටතේ ලියාපදිංචි යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක්;

(xiv) පාංශු සහතිකය - රජය අනුමත පිළිගත් ආයතනයකින් ලබා ගන්නා ලද සහතිකය;

(xv) වියදම් ඇස්තමේන්තුව - වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකු හෝ වරලත් ප්‍රමාණ තක්සේරුකරුවකු සහතික කර තිබිය යුතු ය.

9 වන නියෝගය

*5 වන උපලේඛනය*

යෝජිත සහාධිපත්‍ය දේපළ සංවර්ධනය සඳහා වන
මූලික සැලසුම් නිරාකරණ අයදුම්පත

| කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි |
| --- |
| අංකය : .................................... |
| පෙරසැරි ගාස්තුව : ................................ |
| රිසිට් අංකය හා දිනය : ......................... |

සාමාන්‍යාධිකාරීතුමා,
සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය.

.............................................................
.............................................................
.............................................................
............................................................. වෙතින්.

........................................ නගරයේ ............................ නාගරික කොට්ඨාසයේ ............................ වීදියේ වරිපනම් අංක .................. දරන ස්ථානයේ යෝජිත සහාධිපත්‍ය දේපළ සංවර්ධනය සඳහා මූලික සැලසුම් නිරාකරණය සඳහා මෙයින් අයදුම් කරමි/කරමු.

මම/අපි පිටපත් දෙකකින් යුතුව පහත තොරතුරු ඉදිරිපත් කරමි/කරමු.

1. 1:6000 ට නොඅඩු ප්‍රමාණයකින් යුතු, අදාළ දේපළ පිහිටි ස්ථානය හා යාබද දේපළ සඳහා වන මිනින්දෝරු සැලැස්ම;
2. ඇමුණුමේ දක්වා ඇති තොරතුරු හා දත්ත ඇතුළත් යෝජිත ගොඩනැගිලි සැලසුම;
3. ඉඩමේ හිමිකම් ඔප්පුව.

මම/අපි මූලික සැලසුම් නිරාකරණය, සහාධිපත්‍ය දේපළ සංවර්ධනය සඳහා වන මාර්ගෝපදේශයන් පමණක් බව දනිමි/දනිමු.

දේපළ අයිතිකරුගේ අයිතිය දැක්වෙන ඔහුගේ ලිපිය අමුණා ඇත.

ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය බවට සහතික වෙමි / වෙමු.

දිනය ...................................... ..........................................................
අයිතිකරුගේ / අයදුම්කරුගේ අත්සන

*ඇමුණුම*

1. (1) අයිතිකරුගේ තොරතුරු

නම : ..........................................................................................
ලිපිනය : ..........................................................................................
දුරකථන අංකය : ..........................................................................................

(2) ඉඩමේ පිහිටීම : ..........................................................................................

(අ) පිහිටීම : ..........................................................................................
වරිපනම් අංකය : ..........................................................................................
පළාත් පාලන ආයතනය : ..........................................................................................
වීදිය : ..........................................................................................
මිනින්දෝරු සැලැස්මේ අංකය : ..........................................................................................
(සැලසුම් ඇමිණිය යුතු ය)

(ආ) ඉඩමේ තොරතුරුඃ-

i. ඉඩමේ ස්වාභාවය : ..........................................................................................
වර්ග ප්‍රමාණය (වර්ග මීටර්වලින්) : ..........................................................................................
ඉඩමේ පවත්නා වර්තමාන යොදාගැනීම ඃ

ii. ගොඩනැගිල්ලක් පවතින්නේ නම් තොරතුරුඃ
මහල් ගණන ඃ ..........................................................................................
උපරිම උස (වර්ග මීටර්වලින්) ඃ ..........................................................................................
ගෙබිම් වර්ග ප්‍රමාණය ඃ ..........................................................................................
(අනුමත ගොඩනැගිලි සැලසුමක් ඇත්නම් එය ඇමිණිය යුතු ය)

(3) යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු :

(අ) ව්‍යාපෘතියේ ස්වාභාවය : ..........

(ආ) සැලසුම පිළිබඳ දළ සටහන : ..........
(සැලසුම ඇමිණිය යුතු ය)

(4) පවත්නා යටිතල පහසුකම් :

(අ) ප්‍රවේශ පහසුකම් : ..........

(ආ) ජල සැපයුම : ..........

(ඇ) මලාපවහනය : ..........

(ඈ) විදුලි සැපයුම : ..........

(ඉ) ප්‍රතිකර්ම සැපයුම (මලාපවහන/අපජලය) : ..........

(ඊ) කැලි කසළ අපහරණය : ..........

(5) (අ) ගෙබිමේ ප්‍රමාණය : ..........
(වර්ග මීටර්වලින්)

(ආ) මහල් ගණන හා ගොඩනැගිල්ලේ උස : ..........

(ඇ) බිම් ආවරණය $\frac{\text{බිමෙහි වර්ග ප්‍රමාණය}}{\text{ඉඩමේ වර්ග ප්‍රමාණය}} \times 100$ : ..........

(ඈ) යෝජිත ගොඩනැගිල්ල පිළිබඳ විස්තරයක් යෝජිත කොටස් සංඛ්‍යාව ඇතුලත්ව :-

(ඉ) ගෙබිමේ ප්‍රමාණය පිළිබඳ විස්තර (ව.මී.)

නේවාසික : ..........

අනේවාසික : ..........

කාර්යාල : ..........

අවන්හල් : ..........

වෙනත් : ..........

සම්පූර්ණ ප්‍රමාණය : ..........

(ඊ) යෝජිත වාහන නැවතුම් ඉඩකඩ :-

මෝටර් රථ : ..........

වෙනත් : ..........

(6) තිබෙන පොදු පහසුකම් :-

ව්‍යායාම ශාලාව : ..........

පිහිනුම් තටාක : ..........

ප්‍රජා මධ්‍යස්ථාන : ..........

කළමනාකරණ සංස්ථා රැස්වීමේ ශාලා : ..........

රැස්වීම් ශාලා : ..........

නඩත්තු කාර්යාල : ..........

රියදුරු විවේකාගාර : ..........

ආරක්ෂක නිලධාරි කුටි : ..........

පොදු වැසිකිළි (රියදුරු/ආරක්ෂක කාර්ය මණ්ඩලය/ආබාධිත) : ..........

වහල මහලය : ..........

ඉහත තොරතුරු සත්‍ය බවට මම/අපි සහතික වෙමි/වෙමු.

දිනය : .......... ..........
අයිතිකරු/අයිතිකරුවන්ගේ අත්සන්/අත්සන

2. 3 වන නියෝගයේ සඳහන් පහත දැක්වෙන කරුණු හේතුකොට ගෙන අධිකාරිය විසින් අවස්ථාවෝචිත පරිදි හිමිකරුට, සහ කළමනාකරණ සංස්ථාවට විරුද්ධව පනතට අනුව ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(අ) සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම;

(ආ) ඉදිරිපත් කරනු ලැබූ සැලසුම්, සේවා සැලසුම් හා කළමනාකරණ යෝජනා පිළිවිතරවලට අනුකූලව නොවීම;

(ඇ) පනවන ලද විධිවිධාන උල්ලංඝනය කිරීම;

(ඈ) සහතිකවල කොන්දේසි කඩ කිරීම; සහ

(ඉ) නියමිත සේවා ගාස්තු නොගෙවීම හෝ පැහැර හැරීම.

3. සහාධිපත්‍ය දේපළ තුළ පවත්නා සහාධිපත්‍ය කොටස් හා අතිරේක කොටස් නොවන සියළු අංග පොදු අංගෝපාංග විය යුතු අතර සහාධිපත්‍ය කොටස්වල හා අතිරේක කොටස්වල සියළු මායිම් යාබද ඒකකයේ හෝ පොදු අංගයේ මධ්‍ය රේඛාව වන අතර යාබද දේපළකට මායිම්ව පවතින ගොඩනැගිල්ලක මායිම් බිත්ති සඳහා ද මෙම නියමයන් අදාළ විය යුතු ය.

4. සහාධිපත්‍ය දේපළ පිළිබඳ කළමනාකරණ යෝජනා සම්බන්ධයෙන් සුදුසුකම්ලත් තැනැත්තකුගෙන් ලබාගත් වාර්තාවක් පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් පිළිබඳ සහතිකය අධිකාරියෙන් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

5. සහාධිපත්‍ය දේපළක් ඉදිකිරීමේ දී සේවා කවුන්ටර සැලසුම් කිරීමේ දී ඒවා පහසුවෙන් නඩත්තු කල හැකි වනසේ පිහිටුවිය යුතු ය.

6. නීතිය යටතේ පිහිටුවනු ලබන කළමනාකරණ සංස්ථාව අනිවාර්යෙන්ම අධිකාරියේ ලියාපදිංචි කල යුතු ය.

7. අයිතිකරුවෙකු සහ පදිංචිකරුවෙකු හෝ අයිතිකරුවන් දෙදෙනෙකු අතර සහාධිපත්‍ය කොටසක් භාවිතා කිරීමේ දී හෝ අත්කර ගැනීමේ දී හෝ එයට අනුබද්ධ පොදු පහසුකම් හෝ පොදු අංගෝපාංග භුක්ති විඳීමට යාමේ දී කිසියම් ආරවුලක් උද්ගත වුවහොත් එම ආරවුල පිළිබඳව කළමනාකරණ සංස්ථාවට පැමිණිලි කළ යුතු අතර කළමණාකරණ සංස්ථාව විසින් ආරවුල සමථයකට පත් කිරීමට ප්‍රයත්න දැරිය යුතු ය. කළමනාකරණ සංස්ථාව විසින් ගනු ලබන තීරණයක් සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශවයකට එම ආරවුල පිළිබඳ අභියාචනයක් අධිකාරියට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

8. වගකීම් සහතික :

| | | |
|---|---|---|
| ජල රෝදක ක්‍රමවේදය | - | වසර 10 ක් දක්වා වූ කාලසීමාවක් සඳහා ජල රෝදක ක්‍රමවේදය (**Water proofing System**) සඳහා වගකීම් සහතිකය. |
| ගිනි රක්ෂණය | - | වසරක් සඳහා ලබාගත් ගිනි රක්ෂණය. |
| අකුණු සන්නායක | - | වසර 5 ක් දක්වා වූ කාලයක් සඳහා අකුණු සන්නායක ක්‍රමවේදය සඳහා වූ වගකීම් සහතිකය. |
| ජෙනරේටරය (විදුලි ජනකය) | - | වසරක් සඳහා වූ වගකීම් සහතිකය සමඟ. |
| ජල පොම්ප | - | වසරක් සඳහා වූ වගකීම් සහතිකය සමග. |
| විදුලි සෝපාන | - | වසරක් සඳහා වූ වගකීම් සහතිකය සමග. |

07 - 579/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.